# පටුන


| | පරිච්ඡේදය | පිටු අංකය |
|---|---|---|
| 01 | විධායක සාරාංශය | 1 |
| 02 | වාර්තාවේ ස්වභාවය හා පසුබිම | 2 |
| 03 | විගණන ක්‍රමවේදය | 2 |
| 04 | විෂය පථය | 2 |
| 05 | විෂය පථය සීමාවීම | 3 |
| 06 | ක්‍රියාවලිය | |
| 6.1 | අග්‍රහාර රක්ෂණ ක්‍රමය හඳුන්වාදීම හා විකාශය | 3 |
| 6.2 | අග්‍රහාර රක්ෂණයේ ප්‍රතිලාභ ගෙවීම සහ ගිණුම් තැබීම | 7 |
| 6.3 | ප්‍රතික්ෂේප වූ අයදුම්පත් පිළිබඳ දැනුවත් කිරීම හා ප්‍රතිලාභ ගෙවීම | 9 |
| 6.4 | අග්‍රහාර ප්‍රතිලාභීන් සඳහා චුම්බක කාඩ්පත් හඳුන්වාදීම හා මිලදී ගැනීම | 11 |
| 6.5 | අග්‍රහාර රක්ෂණයේ මූල්‍ය විශ්ලේෂණය | 12 |
| 6.6 | ප්‍රශ්ණාවලි මත ලබාගත් තොරතුරු | 13 |
| 07 | නිරීක්ෂණ | 16 |
| 08 | නිර්දේශ | 19 |
| 09 | දෙමළ පරිවර්ථනය | 21 |
| 10 | ඉංග්‍රීසි පරිවර්ථනය | 45 |
| 10 | ඇමුණුම් | 67 |

**අග්‍රහාර රක්ෂණ භාර අරමුදලෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව**

---------------------------------------------------------------------------------------

**1. විධායක සාරාංශය**

-------------------

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 05/97 මඟින් අග්‍රහාර රක්ෂණ ක්‍රමය 1997 වර්ෂයේදී හඳුන්වා දී තිබුණු අතර එම රක්ෂණ ක්‍රමය තුලින් රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන් සහ එම පවුල්වල සාමාජිකයින්ගේ ජීවන තත්වය නඟා සිටුවීම මූලික අරමුණ කර ගෙන තිබුණි.එලෙස හඳුන්වා දුන් මෙම රක්ෂණ ක්‍රමය සඳහා සංශෝධනයන් විවිධ අවස්ථාවන් වලදී සිදුකරමින් පැවතිය ද අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට නිසි පරිදි නොලැබෙන බවට විගණනයට ලද පැමිණිලි හේතුවෙන් මෙම වාර්තාව නිකුත් කරන ලදී.

ඒ අනුව 1997 ජනවාරි 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 5/97 (vi) පරිදි , රු. 11 ක දායකත්ව මුදලක් යටතේ ආරම්භ කරන ලද අග්‍රහාර රක්ෂණ ක්‍රමය පසුව රු 125 ක දායකත්ව මුදලක් දක්වා වැඩිකර තිබුණු අතර ඉන්අනතුරුව ස්ව කැමැත්ත මත රු. 300 ක හා රු. 600 ක මාසික දායකත්වයක් දරමින් පිළිවෙලින් අග්‍රහාර රිදී හා රන් වශයෙන් තවදුරටත් පුළුල් කර තිබුණි.තවද රාජ්‍ය විශ්‍රාමික නිලධාරීන් සඳහා ද මෙම රක්ෂණ ක්‍රමය 2016 වර්ෂයේ හඳුන්වා දී තිබුණු අතර හඳුන්වාදීමේ දී පැවති රු. 200 ක දායකත්වය 2017 වර්ෂයේ රු. 600 ක් දක්වා ඉහළ නංවා ප්‍රතිලාභ හිමි වීම ජීවිතාන්තය දක්වා වැඩි කර තිබුණි.

සියළුම රාජ්‍ය සේවකයින් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට දායක කර ගැනීම අරමුදලෙහි අරමුණ වුවද එලෙස සියළුම රාජ්‍ය සේවකයින් අරමුදලට දායක කර ගැනීමට අපොහොසත් වී ඇති බවත්,ප්‍රතිලාභ ලබා දීම පහසු කරවීම සඳහා විවිධ වර්ගයේ චුම්බක කාඩ්පත් වරින් වර හඳුන්වා දී තිබුණ ද ඒ තුලින්ද අපේක්ෂා කල පරිදි ප්‍රථිඵල ලබා ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි. තවද අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභයක් වැඩ කරන දින 10 ක් ඇතුළත ප්‍රතිලාභීන්ට ගෙවිය යුතු වුවද අදාළ අයදුම්පත් ප්‍රතික්ෂේප වූ ප්‍රතිලාභීන්ට ඒ සම්බන්ධයෙන් දැනුම් දීමටද මාස 05 ඉක්ම වූ කාලයක් ගත වූ අවස්ථා පවතින බවද ප්‍රතිලාභ ගෙවීම සඳහාද අයදුම්පත් ලද දිනයේ සිට මාස 02 සිට මාස 12 දක්වා දීර්ඝ කාලයක් ගෙන ඇති බවද , 2003 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා දෝෂ සහිත ලෙස හඳුනාගන්නා ලද අයදුම්පත් 30,742 ක් සඳහා ද 2013 ට පසු කාලපරිච්ඡේදයේදී අයදුම්පත් 87,161 ක් සඳහාද දායක මුදල් ගෙවීමට අරමුදල විසින් කටයුතු කර නොතිබීම ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනා ගැනීමට හැකිවිය.

මේ වනවිට ක්‍රමයෙන් අලාභ ලබන තත්ත්වයට පත්වෙමින් පවතින මෙම අරමුදල නැවත ලාභදායි බවට පත්කරමින් ද , ප්‍රතිලාභින් මෙන්ම අරමුදලද අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ නිසි

පරිදි ලබා දීමට සලස්වමින් මෙම අරමුදල ඵලදායි ලෙස යොදා ගැනීම මෙම වාර්තාවෙන් නිර්දේශ කරමි.

## 2. වාර්තාවේ ස්වභාවය හා පසුබිම

---------------------------------

රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ සියළුම නිලධාරීන් සහ එම පවුල්වල සාමාජිකයන් ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම මූලික අරමුණු කර ගනිමින් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් අග්‍රහාර රක්ෂණ ක්‍රමය 1997 වර්ෂයේදී හඳුන්වා දී තිබුණි. ඒ අනුව දශක දෙකකට පමණ පෙර ආරම්භ කරන ලද මෙම රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට නිසි පරිදි නොලැබෙන බවට විවිධ අවස්ථාවන් වලදී විගණනයට තොරතුරු ලැබී තිබුණි. එම තොරතුරු පරීක්ෂාවේ දී ලද නිරීක්ෂණයන්ද මත පදනම්ව 2018 අංක 19 දරන විගණන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව මාහට ලැබී ඇති බලතල මත අග්‍රහාර රක්ෂණයේ කාර්යභාරය පිළිබඳව වැඩිදුර සිදුකරන ලද පරීක්ෂාවන්ට අනුව හඳුනා ගන්නා ලද තොරතුරු ඇතුලත්ව මෙම විශේෂ විගණන වාර්තාව නිකුත් කරන ලදී.

## 3. විගණන ක්‍රමවේදය

--------------------

මෙම වාර්තාව නිකුත් කිරීමේදී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී.

### 3.1 පොත්පත් ලේඛන පරීක්ෂා කිරීම

(i) අග්‍රහාර රක්ෂණයට අදාලව විවිධ ආයතන විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා අදාල ලිපිගොනු

(ii) අග්‍රහාර රක්ෂණයට අදාලව පවතින අයවැය යෝජනා

(iii) සාමාජිකයින් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍ර

### 3.2 අනෙකුත් ක්‍රමවේදයන්

(i) වර්තමානයේ අරමුදල විසින් භාවිතා කරනු ලබන අග්‍රහාර සාමාජික දත්ත පදනම (පද්ධතිය) පරීක්ෂා කිරීම

(ii) රාජ්‍ය නිලධාරීන් සඳහා ප්‍රශ්ණාවලියක් ඉදිරිපත් කර තොරතුරු රැස් කිරීම

(iii) අදාල නිලධාරීන් සමඟ සාකාච්ඡා පැවැත්වීම

## 4 විෂය පථය

-----------

කොළඹ, ගම්පහ, කුරුණෑගල, හලාවත යන දිස්ත්‍රික්ක 04 න් තෝරා ගත් රාජ්‍ය ආයතන 19 ක අග්‍රහාර සාමාජිකයින් 743 ක නියැදියකගෙන් අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ දැනුවත්භාවය හඳුනාගැනීම,අරමුදල විසින් කාඩ්පත් නිකුත් කිරීම, ගෙවීම් කිරීමේ ක්‍රමවේදය හා ඒවා භාවිතය සඳහා පහසුකම් සැලසීම පිළිබඳ පරීක්ෂාවක් සිදු කරන ලදී.

## 5. විෂය පථය සීමා වීම

---------------------

(i) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ක්‍රියාත්මක කෙරුණු අර්ධ රාජ්‍ය ආයතනවල, අග්‍රහාර රක්ෂණය සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදු නොකිරීම.

(ii) විධිමත් හා යාවත්කාලීන දත්ත පද්ධතියක් නොමැති වීම හේතුවෙන් අග්‍රහාර සාමාජික මුදල් ලැබීම් වල නිවැරදිභාවය පරීක්ෂා කිරීම අපහසු වීම.

## 6. ක්‍රියාවලිය

-----------

### 6.1 අග්‍රහාර රක්ෂණ ක්‍රමය හඳුන්වා දීම හා විකාශය

**6.1.1** රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් 1997 ජනවාරි 31 දිනැති චක්‍රලේඛ අංක 05/97 මඟින් (ඇමුණුම 01) අග්‍රහාර රක්ෂණ ක්‍රමය 1997 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාමික වැටුප් සහිත තනතුරු දරන සියලුම නිලධාරීන් සහ එම පවුල්වල සාමාජිකයින්ගේ ජීවන තත්වය නඟා සිටුවීම මෙම රක්ෂණ ක්‍රමය හඳුන්වාදීමේ මූලික අරමුණ ලෙස හඳුනාගෙන තිබුණි.

මෙහිදී රජය විසින් ඉහත සඳහන් කරන ලද නිලධාරින් අනිවාර්යය වූ මෙම වෛද්‍ය රක්ෂණය ක්‍රමය සඳහා රජයේ වියදමින් දායකත්වය ලබා දී ඇත .තවද මෙම අග්‍රහාර නැමැති රක්ෂණ ක්‍රමය යටතේ නිලධාරියාගේ ස්වකැමැත්තෙන් මාසිකව රු. 11 ක වාරික මුදලක් ගෙවා පෞද්ගලික හදිසි අනතුරු රක්ෂණය සහ ණය සුරැකුම් රක්ෂණාවරණය ලබා ගත හැකි විය. මෙම කාර්යය සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රාජ්‍ය සේවා රක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබීය.

**6.1.2** 2005 අයවැය යෝජනා මඟින් රාජ්‍ය නිලධාරීන්ට සමාන හා වැඩි ප්‍රතිලාභ හිමිවන රක්ෂණ යෝජනා ක්‍රමයක් ඇති කිරීමට රජය තීරණය කර තිබුණි. ඉහත චක්‍රලේඛ විධිවිධාන වෙනුවට අංක 12/2005 හා 2005 මැයි 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් (ඇමුණුම 02) පහත සඳහන් දායක රක්ෂණ යෝජනා ක්‍රමයන් 2005 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණි.

- වෛද්‍ය රක්ෂණය
- පෞද්ගලික හදිසි අනතුරු සහ ස්වභාවික මරණ රක්ෂණාවරණය
- ණය සුරැකුම් රක්ෂණාවරණය

මෙලෙස හඳුන්වා දී ඇති මෙම රක්ෂණාවරණය සඳහා සාමාජිකයාගේ වාරිකය රු.75 ක් ලෙසද රජයේ දායකය රු. 69 ක් ලෙසද තීරණය කර තිබුණි .

**6.1.3** අනතුරුව 2013 ජනවාරි 07 දිනැති අංක 12/2005 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය (ඇමුණුම 3) මගින් ඉහතින් සඳහන් කරන ලද නිලධාරින්ට අමතරව රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ පරිබාහිර සේවයන් සඳහා විධිමත් පරිදි තාවකාලිකව මුදා හැර ඇති නිලධාරීන්ද අග්‍රහාර රක්ෂණය ක්‍රමයට දායක වීම අනිවාර්ය කර තිබුණු අතර නිලධාරියාගේ මාසික වාරිකය මෙමගින් රු.125 දක්වා වැඩි කර තිබුණි.

**6.1.4** ආරම්භයේදී සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වෙනමම ඒකකයක් යටතේ ක්‍රියාත්මක කෙරුණු අග්‍රහාර රක්ෂණ ක්‍රමය, ජාතික රක්ෂණ භාර අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අදාළ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම අරමුණු කර ගනිමින්, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (ඇමුණුම 4) 2006 සැප්තැම්බර් සිට ක්‍රියාත්මක කෙරුණි.

**6.1.5** ඉහත කී පනත අනුව මණ්ඩලයේ අරමුණු වන්නේ ,

(අ) මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, අනපේක්ෂිත සෞඛ්‍ය අවදානම, පෞද්ගලික හදිසි අනතුරු හා දේපල හානි සම්බන්ධයෙන්

(i) රාජ්‍ය නිලධරයන්, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්, පළාත් පාලන සේවයේ නිලධරයන් සහ රාජ්‍ය සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන් හා පළාත් පාලන සේවයෙන් විශ්‍රාම ලැබ අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන් හෝ පළාත් පාලන සේවයෙන් දැනට විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන් සඳහා;

(ii) 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනතට අනුකූලව සමෘද්ධි ප්‍රතිලාභීන් හා ඔවුන්ගේ පවුල් සඳහා;

(iii) ගොවීන්, ධීවරයන් සහ ස්වයං රැකියාවල නියුක්ත තැනැත්තන් සඳහා;

(iv) මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් කලින් කල හඳුනාගනු ලැබිය හැකි අවශ්‍යතාවයන් ඇති තැනැත්තන් හෝ තැනැත්තන් කණ්ඩායම් සඳහා,

ප්‍රතිලාභ සහ ආරක්ෂණ සැපයීමය. විවිධ ප්‍රභේදවල ප්‍රතිලාභීන් සඳහා විවිධ යෝජනා ක්‍රම අදාළවේ. විවිධ යෝජනා ක්‍රම වලට අදාළ කාරණා නියම කර දක්වනු ලැබේ.

(ආ) උසස් සෞඛ්‍ය පහසුකම් සැපයීම සඳහාම වෙන්වූ වාට්ටු ඉදිකිරීම හෝ එවැනි පහසුකම් සපයන පවත්නා යම් වාට්ටුවල තත්ත්වය උසස් කිරීම මූලික අරමුණු ඇති යම් සංස්ථාගත සමාගමක ස්කන්ධ හා කොටස් අයිතිවාසිකම් අත්කර ගැනීම මඟින්, කොටස් අත්පත්කර ගැනීමෙහි අර්ථලාභී දායකත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) මේ පනත යටතේ ප්‍රතිලාභ හා ආරක්ෂණ සඳහා හිමිකම ඇති තැනැත්තන්ගේ ණය මුදල් සඳහා ඇපවීම.

(ඈ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරන නියමයක් මඟින් කලින් කල හඳුනාගනු ලැබිය හැකි ආණ්ඩුවේ යම් දේපලක් හෝ යම් ප්‍රභේදයක හෝ පන්තියක දේපලක් වෙනුවෙන් ඇප සැපයීම; සහ

(ඉ) ඉහත අරමුණු මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය හෝ උපකාරී වන වෙනත් සියළු ක්‍රියා හෝ දේ කිරීමත්ය.

**6.1.6** පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව, ජාතික රක්ෂණ භාර අරමුදලක් පිහිටුවනු ලබන අතර, මේ පනත අදාළ වන තැනැත්තන්ට එම අරමුදලින් ප්‍රතිලාභ ගෙවනු ලබන්නේය. පනතේ 18 වන වගන්තියේ නිශ්චය කොට දැක්වෙන මුදල් එම අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

පනතේ 6 වන වගන්තියේ නිශ්චිතව සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත ජාතික රක්ෂණ භාර අරමුදලේ මණ්ඩලයක් පිහිටුවන ලබන්නේය.

**6.1.7** පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ දායකත්වය**,**

(i) රාජ්‍ය නිලධරයෙකු, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු සහ පළාත් පාලන සේවයේ නිළධරයෙකු වූ ද, සහ

(ii) අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවෙන්, පළාත් සභාවකින් හෝ පළාත් පාලන සේවයෙන් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තෙකු වූ ද, සහ

(iii) සමෘද්ධි යෝජනා ක්‍රමයක්, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ හෝ ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකයෙකු හෝ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තෙකු වූ ද,

මේ පනතේ විධිවිධාන යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇත්තා වූ ද, සෑම තැනැත්තෙකුම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පලකරන නියමයක් මඟින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක දායක මුදලක්, එසේ නියම කරනු ලබන යම් වේලාවන්හිදී අරමුදලට ගෙවිය යුතුය.

**6.1.8** ජාතික රක්ෂණභාර අරමුදල මඟින් රජයේ සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට සැපයෙන අග්‍රහාර ප්‍රතිලාභ සංශෝධනය කිරීම සඳහා අංක 15/1806/706/027 දරන 2015 දෙසැම්බර් 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කිරීම සඳහා නිලධාරීන් 05

දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව එම කමිටුව විසින් සිය නිර්දේශ ඇතුළත් වාර්තාවක් (ඇමුණුම 5 ) ලබා දී තිබුණි. පහත තීරණ ඇතුළත් එම වාර්තාව සඳහා 2016 මාර්තු 30 දින අනුමැතිය ලබා දී ඇති බව 2016 අප්‍රේල් 07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ (ඇමුණුම 06) දක්වා තිබුණි.

- මහා භාණ්ඩාගාරයෙන් අතිරේක අරමුදල් අපේක්ෂා නොකර වාර්තාවේ ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස අනුමැතිය ලබා දීම.
- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විමසමින්, මෙම කාර්ය සඳහා චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීමට පියවර ගන්නා ලෙස රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දීම.

**6.1.9** ඒ අනුව රු. 11 ක දායකත්ව මුදලක් යටතේ ආරම්භ කරන ලද අග්‍රහාර රක්ෂණ ක්‍රමය, 2016 අප්‍රේල් 29 දිනැති අංක 12/2005 (vi) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව (ඇමුණුම 07) ස්ව කැමැත්ත මත රු. 600 ක හා රු. 300 ක මාසික දායකත්වයක් දරමින් පිළිවෙලින් රන් හා රිදී වශයෙන් තවදුරටත් පුළුල් වී තිබුණි. එනම් ඉහත 6.1.3 හි සඳහන් රු.125 මාසික වාරිකයේ රැදී සිටීමට හෝ ස්වකැමැත්ත මත රු.300 හා රු.600 බැගින් වාරික ගෙවීම මත වැඩි ප්‍රතිලාභ ලැබීමට හැකියාව ලබා දී තිබුණි.

**6.1.10** ඉහත 6.1.8 ඡේදයෙහි සඳහන් වාර්තාවේ (ඇමුණුම 6) හි අග්‍රහාර රක්ෂණ ක්‍රමය සංශෝධනය කරන ලද ප්‍රතිලාභ පැකේජයේ III වන කොටසේ, මෙම රක්ෂණ ක්‍රමය තුළ දේපල ණය හැර ඇපකරුවෙකු අවශ්‍ය වන ආයතන සංග්‍රහයේ XXIV ඡේදයේ සඳහන් සියලුම ණය ආවරණය වේ. ණයකරු රජයට අයත් ණය ගෙවීමට අපොහොසත් වන අවස්ථාවේදී එවැනි ණය රක්ෂණ සමාගම මඟින් රජයට ගෙවනු ලැබේ. මෙලෙස රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ඇප වන උපරිම ණය ප්‍රමාණය රු. 600,000 ක් වන බවත් ඊට පහත සඳහන් ප්‍රතිලාභ 04 ක්ද ඇතුළත් කර තිබුණි.

**ප්‍රතිලාභ**

**---------**

i. යම් අසනීපයක් හේතුවෙන් ණයකරු සම්පූර්ණයෙන් හෝ කොටසක් ආබාධිත තත්ත්වයට පත් වුවහොත් හෝ ණයකරුගේ ජීවිතය අහිමි වුවහොත් රක්ෂණ සංස්ථාව විසින් රජයට හිඟ ණය මුදලේ ප්‍රමාණය ගෙවිය යුතුය.

ii. උපරිම ණය සුරක්ෂිතය රු. 600,000 ට සීමා වන බැවින් නිලධාරියා සඳහා ණය හිමිකම් ඔහුගේ වැටුප මත තීරණය කළ යුතුය.

iii. රක්ෂිත මුදල හිඟ ණය මුදල් ශේෂය වේ.

iv. ණය මුදල ආපසු ගෙවීමේ කාලය වයස අවුරුදු 55 නොඉක්මවිය යුතු අතර සේවා දිගුවක් ලබා දී ඇතිනම් එය අවුරුදු 60 නොඉක්මවිය යුතුය.

**6.1.11** තවද, ඉහත 6.1.2 හි සඳහන් චක්‍රලේඛයට 2016 අප්‍රේල් 29 දිනැතිව සිදු කළ අංක 12/2005 (VI) දරන සංශෝධනය මඟින් රාජ්‍ය විශ්‍රාමික නිලධාරීන් සඳහා රු. 200/- ක අනිවාර්ය මාසික දායකත්වය යටතේ රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී තිබුණු අතර එහි ප්‍රතිලාභ හිමිවීම වයස අවුරුදු 70 දක්වා සීමා කර තිබුණි. ඉන් පසු අංක 12/2005 (vii) හා 2017 ඔක්තෝබර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් (ඇමුණුම 08) රු. 200 ක දායකත්වය රු. 600 ක් දක්වා ඉහළ නංවා ප්‍රතිලාභ හිමි වීම ජීවිතාන්තය දක්වා දීර්ඝ කර තිබුණි. තවද එම කමිටු වාර්තාව අනුව ප්‍රතිලාභ අයදුම්පත් ග්‍රාම නිලධාරී සත්‍ය බව සහතික කිරීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හරහා යොමු කළ යුතු බවද සඳහන් වේ.

**6.1.12** 2017 මාර්තු 20 දිනැති, අංක 135-03 දරන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය (ඇමුණුම 09) යටතේ අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා රු. 1,000 ක මාසික වාරිකයක් මත රන් හා රු. 600 ක මාසික වාරිකයක් මත රිදී අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයන් හඳුන්වා දී තිබුණු අතර රාජ්‍ය සේවකයින් වෙත ලබා දෙන සමාන ප්‍රතිලාභ ඔවුන් වෙතද ලබා දී තිබුණි.

**6.2 අග්‍රහාර රක්ෂණයේ ප්‍රතිලාභ ගෙවීම සහ ගිණුම් තැබීම**

**-------------------------------------------------------**

**6.2.1** 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ විධිවිධාන අනුව (ඇමුණුම 4) අග්‍රහාර රක්ෂණයට පහත සඳහන් නිලධාරීන්ද අදාළ වන අතර ඒ අනුව එය රාජ්‍ය සේවකයින් සඳහා අනිවාර්ය රක්ෂණයක් වේ.

i. රජයේ නිලධාරීන්

ii. රජයේ සේවයෙන් විශ්‍රාම ලැබ ආණ්ඩුවේ විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන්

iii. පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්

iv. පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබ පළාත් සභාවෙන් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන්

v. පළාත් පාලන සේවයේ සාමාජිකයින්

vi. පළාත් පාලන සේවයෙන් විශ්රාම ලැබ පළාත් පාලන සේවයෙන් විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන්

(මෙම අරමුදල රාජ්‍ය අංශයට අයත් නොවන වෙනත් පාර්ශවයන්ටද අදාළ වන බව පනතේ දක්වා ඇත.)

**6.2.2** මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ තොරතුරු (ඇමුණුම 10) අනුව 2019 ජුනි 30 දින වන විට මුළු රාජ්‍ය සේවයේ නිලධාරීන් 1,381,024 ක් වූ අතර ඉන් ත්‍රිවිධ හමුදාව හැර මුළු රාජ්‍ය නිලධාරීන් 1,128,052 ක් විය. ඉන් බැංකු හා අර්ධ රාජ්‍ය

සේවයට අයත් කොටස වන 248,625 ඉවත් කළ විට අග්‍රහාර හිමිකම් ලබන රාජ්‍ය නිලධාරීන් ගණන 879,427 ක් වන අතර, 2019 ජුනි 30 දිනට අරමුදල විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු රාජ්‍ය නිලධාරීන් ගණන 743,973 ක් බවට හඳුනා ගැනීමට හැකි විය.

| | | සාමාන්‍ය | රන් | රිදී |
|---|---|---|---|---|
| අරමුදලේ ලියාපදිංචි රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව (ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු අනුව) | 743,973 | 334,073 | 331,518 | 78,382 |
| අග්‍රහාර සඳහා සුදුසුකම් ඇති රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව) | 879,427 | | | |
| | ----------- | | | |
| ලියාපදිංචි නොවූ රාජ්‍ය නිලධාරීන් ගනන | 129,454 | | | |
| | ======= | | | |

**6.2.3** තවද අංක 12/2005 හා 2005 මැයි 18 දිනැති 2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධාරීන් සඳහා වූ නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර) සඳහා වූ චක්‍රලේඛයේ (ඇමුණුම 2) 7.2 ඡේදය ප්‍රකාරව සතියේ වැඩ කරන දින 10 ක් ඇතුළත රක්ෂණ ප්‍රතිලාභ ගෙවීමට ක්‍රියා කළ යුතු බව සඳහන් වේ.

**6.2.4** 2006 අගෝස්තු 29 දිනැති 2006 අංක 28 දරන ජාතික රක්ෂණභාර අරමුදල් පනතේ 13(ඉ) ඡේදය ප්‍රකාරව අරමුදල සම්බන්ධයෙන් සාමාන්‍ය ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර අරමුදලේ එක් එක් සාමාජිකයා සම්බන්ධයෙන් වෙන් වශයෙන් වූ පුද්ගල ගිණුම් පවත්වාගෙන යා යුතු විය.

**6.2.5** කෙසේ වුවද, රජය විසින් වාර්ෂිකව අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණු දායක මුදල් ප්‍රමාණය 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පහත වගුව අංක 01 හි පරිදි වේ.

**වගුව අංක 01 - රජය අරමුදලට ප්‍රේෂණය කර තිබුණු දායක මුදල් 2013 - 2018**

| වර්ෂය | ලබා දුන් දායක මුදල |
|---|---|
| | රු.මි |
| 2013 | 410 |
| 2014 | 400 |
| 2015 | 400 |
| 2016 | 550 |
| 2017 | 500 |
| 2018 | 750 |

එක් එක් වර්ෂයේ රජයේ වාර්ෂික අයවැය සඳහා තොරතුරු ඉදිරිපත් කිරීමේදී එම අවස්ථා වනවිට අරමුදල සතුව පවතින තොරතුරු මත සාමාජිකයින් සංඛ්‍යාව තීරණය කොට එම සංඛ්‍යාව ඉහත කී 6.1.2 ඡේදයේ සඳහන් රු. 69 න් ගුණ කර ලැබෙන අගය රජයේ දායකත්වය ලෙස දක්වා ඇත.

**6.3 ප්‍රතික්ෂේප වූ අයදුම්පත් පිළිබඳ දැනුවත් කිරීම හා ප්‍රතිලාභ ගෙවීම**

**6.3.1** විවිධ හේතූන් මත අග්‍රහාර රක්ෂණ වන්දි ගෙවීමට නොහැකිව අයදුම්පත් ප්‍රතික්ෂේප වී තිබුණු අතර එම ප්‍රතික්ෂේප වූ අයදුම්පත් පිළිබඳ ප්‍රතිලාභීන් වෙත දැන්වීමට මාස 05 කට වඩා ගත වූ අවස්ථා පිළිබඳ විශ්ලේෂණයක් පහත වගුව අංක 02 හි දැක්වේ.

**වගුව 02 - ප්‍රතික්ෂේප වූ අයදුම්පත් පිළිබඳ දැන්වීමට ගත වූ කාලය**

| ජාතික හැඳුනුම්පත් අංකය | අයදුම්පත් ලද දිනය | ප්‍රතිචාර දැක්වූ දිනය | කාල ප්‍රමාදය | ආයතනයේ පරිගණක පද්ධතිය අනුව වටිනාකම | ගෙන තිබූ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| 597924720V | 11/21/2013 | 12/31/2015 | 2 Year | 0 | FAULTS INFORMED |
| 621273965V | 4/25/2011 | 6/15/2012 | 1 Year and 2 Month | 300,000 | FAULTS INFORMED |
| 697331581V | 8/15/2012 | 2/28/2013 | 6 Month | 3,500 | FAULTS INFORMED |
| 652621759V | 9/10/2012 | 2/27/2013 | 5 Month | 0 | FAULTY |
| 807031104V | 9/20/2012 | 3/8/2013 | 6 Month | 0 | FAULTS INFORMED |
| 607920052X | 10/3/2012 | 2/19/2013 | 4 ½ Month | 3,500 | FAULTS INFORMED |
| 582291055V | 10/23/2012 | 5/20/2013 | 7 Month | 0 | FAULTS INFORMED |
| 665960919V | 10/23/2012 | 5/20/2013 | 7 Month | 3,500 | FAULTS INFORMED |
| 643373262V | 10/31/2012 | 5/8/2013 | 7 Month | 19,030 | FAULTS INFORMED |
| 731080275V | 11/5/2012 | 4/11/2013 | 5 Month | 0 | FAULTY |
| 835824195V | 11/29/2012 | 5/27/2013 | 6 Month | 25,888 | FAULTS INFORMED |
| 652073875V | 12/11/2012 | 5/20/2013 | 5 Month | 3,500 | FAULTS INFORMED |
| 602810780V | 1/21/2013 | 7/15/2013 | 6 Month | 8,250 | FAULTS INFORMED |
| 761950410V | 3/6/2013 | 10/4/2013 | 7 Month | 0 | FAULTS INFORMED |
| 660582070V | 5/28/2013 | 12/2/2013 | 7 Month | 3,500 | FAULTS INFORMED |

| | | | | | |
|---|---|---|---|---|---|
| 673093167V | 10/24/2013 | 4/10/2014 | 6 Month | 0 | FAULTY |
| 635651156V | 12/11/2013 | 6/28/2014 | 6 Month | 300,000 | FAULTS INFORMED |
| 738420160V | 1/22/2019 | 6/14/2019 | 5 Month | 0 | REJECT INFORMED |
| 805914084V | 1/25/2019 | 10/21/2019 | 9 Month | 0 | REJECT INFORMED |
| 611622988V | 3/29/2019 | 8/22/2019 | 5 Month | 0 | REJECTED |

**6.3.2** 2019 දෙසැම්බර් 13 දින විගණනයට ලබා දුන් 2018 හා 2019 වර්ෂයේ අග්‍රහාර හිමිකම් ගෙවීම් තොරතුරු අනුව හිමිකම් අයදුම්පත්‍ර ලැබීමෙන් පසු හිමිකම් ගෙවීමට ගත වූ කාලය පහත දැක්වේ.

**වගුව අංක 03 - හිමිකම් ගෙවීමට ගත වූ කාලය**

| කාල සීමාව | හිමිකම් ගෙවීම් ප්‍රමාණය |
|---|---|
| මාස 02-04 | 16,552 |
| මාස 04-06 | 2,249 |
| මාස 06-08 | 445 |
| මාස 08-10 | 127 |
| මාස 10-12 | 19 |

**6.3.3** තවද, 2003 වර්ෂයේ සිට 2013 වර්ෂයට අදාළව මෙම වාර්තාවේ දිනය දක්වා ගෙවීම් සිදු නොකරන ලද අග්‍රහාර හිමිකම් දෝෂ සහිත අයදුම්පත් පහත පරිදි හඳුනාගැනීමට හැකි විය.

**වගුව අංක 04 - හඳුනාගන්නා ලද දෝෂ සහිත අයදුම්පත් 2003-2013**

| වර්ෂය | හිමිකම් දෝෂ සහිත අයදුම්පත් |
|---|---|
| 2003 | 6 |
| 2005 | 1 |
| 2006 | 2,484 |
| 2007 | 1,073 |
| 2008 | 257 |
| 2009 | 1,841 |
| 2010 | 4,564 |
| 2011 | 5,716 |
| 2012 | 6,746 |
| 2013 | 7,931 |

| | |
|---|---|
| 2006-2013 | 123 |
| | 30,742 |

**6.3.4** තවද, 2013 වර්ෂයේ සිට 2019 වර්ෂයට අදාළව මෙම වාර්තාවේ දිනය දක්වා ප්‍රතික්ෂේප වූ අයදුම්පත් පහත වගුවෙහි දැක්වේ.

**වගුව අංක 05 - ප්‍රතික්ෂේප වූ අයදුම්පත් අග්‍රහාර හිමිකම් අයදුම්පත්**

| වර්ෂය | ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| 2013 | 276 |
| 2014 | 13,227 |
| 2015 | 11,668 |
| 2016 | 11,693 |
| 2017 | 14,351 |
| 2018 | 16,586 |
| 2019 | 19,360 |
| | 87,161 |

## 6.4 අග්‍රහාර ප්‍රතිලාභීන් සඳහා චුම්භක කාඩ්පත් (E-Card) හඳුන්වා දීම හා මිලදී ගැනීම

**6.4.1** රජයේ සේවකයන් සඳහා අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ මුදල් ගෙවීමකින් තොරව රෝහල් ගතවීමේ පහසුකම් (තැන්පතු මුදලක් ගෙවීමකින් තොරව) සලසා දීමේ අරමුණින් 2011 වසරේ සිට අග්‍රහාර ප්‍රතිලාභීන් සඳහා චුම්බක කාඩ්පත් (E-Card) හඳුන්වා දීමට ජාතික රක්ෂණ භාර අරමුදල සැලසුම් කර තිබුණි.

**6.4.2** වෙබ් අඩවියේ අග්‍රහාර රක්ෂණය තුළ අත්වැල් බැඳගත් රෝහල් යටතේ රෝහල් 25 ක් දැක්වෙන අතර අග්‍රහාර චුම්භක කාඩ්පත් හිමියන්ට එම රෝහල් මඟින් ලැබෙන ප්‍රතිලාභ පහත පරිදි විය.

- විශේෂ ශල්‍යකර්ම පැකේජ
  - අග්‍රහාර ප්‍රතිලාභීන් හට විශේෂ අනුපාතයකින් ශල්‍යකර්ම පැකේජ ලබාගත හැක.
- අභ්‍යන්තර රෝගීන් සඳහා ලබාගත හැකි වට්ටම්
  - අග්‍රහාර ප්‍රතිලාභීන් හට රෝගියා ඇතුලත් කිරීමේදී රෝහල් ගාස්තුවක් අය නොකෙරේ.
  - රෝහල් කාමර සඳහා ගාස්තුව

- රසායනාගාර පරීක්ෂණ
- විකිරණ පරීක්ෂණ

• බාහිර රෝගීන් සඳහා ලබාගත හැකි වට්ටම්
    - රසායනාගාර පරීක්ෂණ
    - විකිරණ පරීක්ෂණ

**6.4.3** විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2020 ජනවාරි 06 දින වන විට සාමාජිකයින් 960,684 ක් වෙත අග්‍රහාර කාඩ්පත් නිකුත් කර තිබුණි.

**වගුව අංක 06 - නිකුත් කරන ලද E-Card ප්‍රමාණය**

| | එකතුව | සාමාන්‍ය | රන් | රිදී |
|---|---|---|---|---|
| අග්‍රහාර කාඩ්පත් නිකුත් කිරීම | 960,684 | 540,684 | 348,000 | 72,000 |

**6.4.4** 2011 නොවැම්බර් 04 දින E Care Solution (Pvt) Ltd ආයතනයෙන් මුළු පිරිවැය රු.21,820,000 කට චුම්භක කාඩ්පත් 650,000 ක් සහ චුම්භක කාඩ්පත් කියවන යන්ත්‍ර 20 ක් මිලදී ගැනීම සඳහා ඇණවුම් කර තිබුණි. ඒ සඳහා අරමුදල වෙතින් එහි මුළු වටිනාකමින් සියයට 20 ක් හෙවත් රු.4,364,000 ක් අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. 2012 මාර්තු 21 දින කාඩ්පත් 100,000 ක් සඳහාත් 2012 ජූලි 24 දින කාඩ්පත් 150,000 ක් සඳහාත් පිළිවෙලින් රු.2,440,000 ක් සහ රු.3,585,000 ක් ගෙවීම් කර තිබුණි. එම ගෙවීම් කරන ලද කාඩ්පත්වලට අදාළව 2014 ඔක්තෝබර් 10 දින කාඩ්පත් 221,630 ක් පමණක් සපයා තිබුණි.

**6.4.5** තවද රු. 1,992,500 ක වටිනාකමැති අග්‍රහාර සාමාන්‍ය කාඩ්පත් 100,000 ක් 2018 ජූනි 07 දින Ceylon Business Appliances (Private) Ltd වෙතින් අරමුදල මිලදී ගෙන තිබුණු අතර රු. 2,204,032.50 ක අග්‍රහාර ගෝල්ඩ් කාඩ්පත් 150,000 ක්ද අරමුදල විසින් මිලදී ගෙන තිබුණි.

**6.5 අග්‍රහාර රක්ෂණයේ මූල්‍ය විශ්ලේෂණය**

-------------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අග්‍රහාර අංශයේ මූල්‍ය විශ්ලේෂණය පහත වගුව අංක 07 හි දැක්වේ.

**වගුව අංක 07 - අග්‍රහාර රක්ෂණයේ මූල්‍ය විශ්ලේෂණය 2014-2018**

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| අග්‍රහාර වාරික ආදායම | 1,494,899,976 | 1,636,567,419 | 2,004,436,602 | 2,746,522,599 | 4,037,420,904 |
| -සාමාජික දායකත්වය | 1,904,899,976 | 1,236,567,415 | 1,454,436,602 | 2,226,522,599 | 3,267,420,904 |

| | | | | | |
|---|---|---|---|---|---|
| -රජයේ දායකත්වය | 400,000,000 | 400,000,000 | 550.000,000 | 500,000,000 | 750,000,000 |
| **හිමිකම් ගෙවීම** | 1,228,123,716 | 1,561,625,099 | 1,950,168,496 | 2,873,715,118 | 4,301,595,402 |
| **බදු පෙර ලාභය (අග්‍රහාර අංශය)** | 266,776,260 | 74,942,320 | 54,268,106 | (127,192,519) | (264,174,498) |

ඒ අනුව රජයේ දායකය නිසා අරමුදල ලාභ ලබා තිබුණද 2017 හා 2018 වර්ෂයන්ට අදාළව පිළිවෙලින් රු. මිලියන 127 ක් හා රු. මිලියන 264 ක බදු පෙර අලාභ වාර්තා කර ඇත.

**6.6 ප්‍රශ්ණාවලිය මත ලබා ගත් තොරතුරු**

**6.6.1** අග්‍රහාර රන්, රිදී හා සාමාන්‍ය රක්ෂණාවරණ යෝජනා ක්‍රමය ශ්‍රී ලාංකික සියලුම රාජ්‍ය සේවකයින් ආවරණය කරනු ලබන හෙයින් නියැදි පදනමක් මත තෝරාගත් ආයතන 19 ක් තුළින් රාජ්‍ය සේවකයින් 743 ක් ආවරණය වන පරිදි අග්‍රහාර රක්ෂණාවරණය පිළිබඳ තෝරා ගත් වැදගත් නිර්ණායක ඔස්සේ ප්‍රශ්ණාවලියක් ඉදිරිපත් කර අතර නියැදි පදනම මත තෝරා ගත් ආයතන 19 පහත පරිදි වේ.

| ආයතනය | ආයතනය නියෝජනය කරන ලද දිස්ත්‍රික්කය | නියෝජනය වූ අග්‍රහාර සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | කොළඹ | 46 |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව | කොළඹ | 41 |
| රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | කොළඹ | 30 |
| තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | කොළඹ | 12 |
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | කොළඹ | 27 |
| රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | කොළඹ | 33 |
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | කොළඹ | 28 |
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | කොළඹ | 28 |
| වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | කොළඹ | 30 |
| භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | කොළඹ | 21 |
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | කොළඹ | 77 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | ගම්පහ | 40 |
| මහනගර සභාව - ගම්පහ | ගම්පහ | 43 |
| ප්‍රාදේශීය සභාව - ගම්පහ | ගම්පහ | 39 |
| මහනගර සභාව - කඩුවෙල | ගම්පහ | 46 |
| පළාත් සෞඛ්‍ය කාර්යාලය - වයඹ | කුරුණෑගල | 50 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | කුරුණෑගල | 78 |
| වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | කුරුණෑගල | 19 |
| මහනගර සභාව - හලාවත | හලාවත | 55 |

---------

743

======

**6.6.2** එම ආයතන වෙත ප්‍රශ්ණාවලිය ඉදිරිපත් කර ලබා ගත් තොරතුරු පහත පරිදි සාරාංශ ගත කර දැක්විය හැක

**වගුව අංක 08 - අග්‍රහාර රක්ෂණය පිළිබඳ කරන ලද සමීක්ෂණයේ ප්‍රතිඵල**

| | නිර්ණායක | නිලධාරීන් සංඛ්‍යාව | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| | | (ඔව්) | (නැත) | (ඔව්) | (නැත) |
| (i) | අග්‍රහාර රක්ෂණාවරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් තිබේද? | 363 | 259 | 49% | 35% |
| (ii) | අග්‍රහාර හිමිකම් සඳහා ඉල්ලුම් කළ මුළු මුදල ලැබීම | 219 | 180 | 29% | 24% |
| (iii) | E-Card පත ලැබීම | 312 | 350 | 42% | 47% |
| (iv) | E-Card පත මඟින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්ද | 66 | 549 | 9% | 74% |
| (v) | E-Card පත් මඟින් ප්‍රතිලාභ ලබා දෙන පෞද්ගලික රෝහල් පිළිබඳ දැනුවත්ද? | 66 | 404 | 9% | 54% |
| (vi) | එම රෝහල් මඟින් රන්, රිදී කාඩ්පත් හිමියන් වෙත ලබාදෙන වට්ටම් ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්ද? | 79 | 343 | 11% | 46% |
| (vii) | ප්‍රදේශයට ආසන්නව අග්‍රහාර වෛද්‍ය පහසුකම් සලසා දෙන රෝහල් තිබේද? | 116 | 162 | 16% | 22% |
| (viii) | අග්‍රහාර රක්ෂණාවරණය හැර වෙනත් රක්ෂණයක් පිළිබඳ ඔබ දැනුවත්ද? | 160 | 480 | 22% | 65% |
| (ix) | අග්‍රහාර ආයතනය සමඟ පහසුවෙන් සම්බන්ධවීමට (දුරකථන මඟින්, Web site හරහා වැනි) පවතින හැකියාව පිළිබඳ සෑහීමකට පත්වන්නේද? | 317 | 223 | 43% | 30% |

**6.6.3** පහත වගුවෙහි සඳහන් තොරතුරුවලට අනුව අග්‍රහාර සාමාජිකයින් 743 අතුරින් අග්‍රහාර රක්ෂණාවරණය පිළිබඳ ඔවුන් තුළ පවතින දැනුවත්භාවය පිළිබඳ සාමාජිකයින් 622 ක් පිළිතුරු ලබා දී තිබූ අතර එය තෝරා ගත් ප්‍රතිශතයෙන් සියයට 84 ක ප්‍රතිශතයක් නියෝජනය කරනු ලැබීය. ඒ අනුව අග්‍රහාර රක්ෂණාවරණය පිළිබඳ සාමාජිකයින් 363 කට එනම් සියයට 49 ක ප්‍රමාණයක් සඳහා ප්‍රමාණවත් දැනුවත්භාවයක් පවතින බවටත් සියයට 35 ක් සඳහා ප්‍රමාණවත් දැනුවත්භාවයක් නොමැති බවටත් හඳුනා ගැනීමට හැකි විය.

**වගුව අංක 09 - දැනුවත්භාවය පිළිබඳ ප්‍රශ්ණාවලියෙන් ලද තොරතුරු**

| | මුළු ප්‍රශ්ණාවලි ගණන | ප්‍රමාණවත් දැනුවත්භාවයක් තිබේද? | | |
|---|---|---|---|---|
| | | ඔව් | නැත | පිළිතුරු සපයා නැත |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 46 | 28 | 17 | 1 |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 41 | 21 | 14 | 6 |
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 77 | 45 | 28 | 4 |
| රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 30 | 17 | 7 | 6 |
| තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 12 | 10 | 2 | 0 |
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 27 | 14 | 6 | 7 |
| රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 33 | 13 | 18 | 2 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කුරුණෑගල | 78 | 42 | 23 | 13 |
| වයඹ ප.සෞ. දෙපාර්තමේන්තුව | 50 | 27 | 14 | 9 |
| නගර සභාව හලාවත | 55 | 22 | 20 | 13 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගම්පහ | 40 | 20 | 8 | 12 |
| වයඹ පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව | 19 | 11 | 6 | 2 |
| ගම්පහ ප්‍රාදේශීය සභාව | 39 | 10 | 21 | 8 |
| ගම්පහ මහනගර සභාව | 43 | 24 | 8 | 11 |
| කඩුවෙල මහනගර සභාව | 46 | 16 | 24 | 6 |
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 28 | 11 | 13 | 4 |
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 28 | 9 | 13 | 6 |
| වෙළඳ හා ආ.ප්‍ර. දෙපාර්තමේන්තුව | 30 | 15 | 11 | 4 |
| භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු | 21 | 8 | 6 | 7 |
| එකතුව | 743 | 363 | 259 | 121 |
| | | **622** | | |
| මුළු ප්‍රශ්ණාවලි ගණනෙන් ප්‍රතිශතයක් ලෙස | | 49% | 35% | 6% |
| | | **84%** | | |

**6.6.4** කෙසේ වුවද, 2018 වර්ෂයේ හා 2019 වර්ෂයේ දිවයිනේ සියළුම පළාත් ආවරණය කරමින් පිළිවෙලින් දැනුවත් කිරීමේ වැඩසටහන් 293 ක් හා 372 ක් පවත්වා තිබුණු බව ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව හෙළිදරව් විය.

## 7 නිරීක්ෂණ

-----------

**7.1** ඉහත 6.2.1 ඡේදය ප්‍රකාරව අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සියළුම රාජ්‍ය සේවකයින් ආවරණය කර ගනිමින් සිදු කරනු ලබන අනිවාර්ය රක්ෂණාවරනයක් වන නමුත් ඉහත 6.2.2 ඡේදයෙහි දැක්වෙන තොරතුරු අනුව රාජ්‍ය සේවකයින් 129,454 දෙනෙකු 2019 ජුනි 30 දින වන විටත් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට දායක කර ගැනීමට අරමුදල අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

**7.2** ඉහත 6.1.2 ඡේදයෙහි පරිදි මෙම රක්ෂණ යෝජනා ක්‍රමයට රජයේ දායකත්වය රු.69 ක් ලෙස සඳහන් වුවද 6.1.3 හි සඳහන් චක්‍රලේඛයෙන් රක්ෂණය අනිවාර්ය කරන නිලධාරින් ගේ දායකත්වය රු.125 කරනු ලබන අවස්ථාවේ දී ද, 6.1.9 ඡේදයෙහි පරිදි ස්වකැමැත්ත මත රු.300 හා රු.600 දක්වා දායකත්වය ඉහළ නැංවීමේ දී ද රජයේ දායකත්වය පිළිබඳව සඳහන් කර නොතිබුණි. නමුත් 6.2.5 ඡේදයෙහි පරිදි දිගින් දිගටම අරමුදල විසින් මහාභාණ්ඩාගාරයෙන් සියළුම සාමජිකයින් වෙනුවෙන් රු.69 ක දායක මුදල් ගෙන්වා ගනිමින් පවතින බව නිරීක්ෂණය විය.

**7.3** ඉහත 6.1.1 සිට 6.1.7 ඡේදයන්හි සඳහන් පරිදි මෙම අග්‍රහාර රක්ෂණ දායක මුදලෙන් රාජ්‍ය සේවකයින්, විශ්‍රාමික රාජ්‍ය සේවකයින් හා අර්ධ රාජ්‍ය සේවයේ සේවකයින් පමණක් දායකවන බව දන්වා තිබුණද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ආරම්භ කර තිබුණු සෞඛ්‍ය රක්ෂණාවරණයක ආදායම් හා වියදම්ද ආංශික මූල්‍ය ප්‍රකාශනවල අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ ගිණුම් ගත කර තිබීම හේතුවෙන් අග්‍රහාර රක්ෂණයට අදාළ මෙහෙයුම් තත්ත්වය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් වී නොතිබුණි.

**7.4** තවද 6.2.4 ඡේදයෙහි සඳහන් පරිදි, එක් එක් සාමාජිකයා සම්බන්ධයෙන් වෙන් වශයෙන් වූ පුද්ගල ගිණුම් යාවත්කාලීනව පවත්වාගෙන නොමැති අතර 6.2.5 ඡේදය ප්‍රකාරව රජය විසින් වාර්ෂිකව එක් වරකදී අරමුදල වෙත දායක මුදල් ප්‍රේෂණය කර තිබුණි. තවද, අග්‍රහාර සාමාන්‍ය, රන්, රිදී, වාරික මුදල් විශ්‍රාමික හා අර්ධ රාජ්‍ය නිලධාරීන්ට අදාළව මූල්‍ය ප්‍රකාශනවල එක් ආදායම් හා වියදම් අයිතමයක් ලෙස හඳුනාගෙන තිබුණු අතර යාවත්කාලීන දත්ත පදනමක් නොමැතිවීම හේතුවෙන් එම ආදායම නිවැරදි බවට හෝ රක්ෂණය යටතේ ලැබෙන ආදායම්හි ලැබිය යුතු ආදායම් හඳුනාගැනීම සඳහා පදනමක් නිරීක්ෂණය නොවීය.

**7.5** නව අග්‍රහාර රක්ෂණ ක්‍රමය 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණද එය ආරම්භ කිරීමට පෙර විධිමත් විශ්ලේෂණයක් සිදු කිරීමට හා එය අනිවාර්යය රක්ෂණ ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අරමුදල කටයුතු කර නොතිබුණු අතර, 6.1.11 ඡේදයෙහි පරිදි විශ්‍රාමිකයන්ට අග්‍රහාර රක්ෂණ ආවරණය ලබා දී තිබුණ ද 2018 වර්ෂයේ අයවැය කතාවේ 259 වන අයවැය යෝජනාව ප්‍රකාරව එම සහනය සෑම විශ්‍රාමිකයෙකු සඳහාම ලබා දීමට කටයුතු කර නොතිබුණි. තවද 6.1.12 ඡේදයේ සඳහන් පරිදි, අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා අග්‍රහාර රක්ෂණය සඳහා බඳවා ගැනීමට 2017 පෙබරවාරි 22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පමණක් තීරණය කර තිබූ අතර බඳවා ගැනීමට අදාල අනුමැතියක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

**7.6** ඉහත 6.2.3 ඡේදයෙහි පරිදි අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභයක් වැඩ කරන දින 10 ක් ඇතුළත ප්‍රතිලාභීන්ට ගෙවිය යුතු වුවද අදාළ අයදුම්පත් ප්‍රතික්ෂේප වූ ප්‍රතිලාභීන්ට ඒ සම්බන්ධයෙන් දැනුම් දීමටද මාස 05 ඉක්ම වූ කාලයක් ගත වූ අවස්ථා කිහිපයක් පැවති බව ඉහත වගුව අංක 5 තොරතුරු අනුව නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් මෙම අරමුදලින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. තවද ප්‍රතිලාභ ගෙවීම සඳහාද අයදුම්පත් ලද දිනයේ සිට මාස 02 සිට මාස 12 දක්වා දීර්ඝ කාලයක් ගෙන ඇති බවද ඉහත වගුව අංක 03 හි සඳහන් තොරතුරු අනුව තවදුරටත් නිරීක්ෂණය විය. තවද 2003 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ඉහත වගුව අංක 3 දැක්වෙන පරිදි දෝෂ සහිත ලෙස හඳුනාගන්නා ලද අයදුම්පත් 30,742 ක් සඳහා වගුව අංක 4 දැක්වෙන පරිදි 2013 ට පසු කාලපරිච්ඡේදයේදී අයදුම්පත් 87,161 ක් සඳහාද දායක මුදල් ගෙවීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

**7.7** ඉහත 6.4.3 ඡේදයෙහි දැක්වෙන කරුණු අනුව ලියාපදිංචි වූ සාමාජිකයින් ඉක්මවා අග්‍රහාර කාඩ්පත් 216,711 ක් නිකුත් කර ඇති බව පැහැදිලි වන අතර ඒ අනුව මෙම කාඩ්පත් නිකුත් කිරීමේ අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

**7.8** තවද, ඉහත 7.6 ඡේදයෙහි සඳහන් කාඩ්පත් භාවිතා කිරීමේදී අදාළ රෝහල් යටතේ සියයට 05 සිට සියයට 15 දක්වා වට්ටම් ලැබෙන බවත් එක් එක් වර්ෂවලදී එම ප්‍රතිශත වෙනස්විය හැකි බවත් විගණනයට ප්‍රකාශ කළ නමුත් එම වට්ටම් හා විශේෂ අනුපාත පිළිබඳව නිශ්චිත තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට අරමුදල අපොහොසත් විය.

**7.9** අග්‍රහාර රක්ෂණය අනිවාර්ය රක්ෂණ ක්‍රමයක් වුවද විගණනය විසින් සිදුකරන ලද නියදි පරීක්ෂාවට අනුව රාජ්‍ය නිලධාරීන් සියයට 35 ක් පමණ මෙම රක්ෂණ ක්‍රමය පිළිබඳව දැනුවත් බවක් නොමැති අතර, පිළිතුරු ලබාදුන් නිලධාරීන්ගෙන් සියයට 47 කට පමණ 2019 සැප්තැම්බර් 19 දින වන විටත් E-Card පත නොලැබී තිබුණි.තවද තෝරා ගන්නා ලද නියැදියෙන් සියයට 74 ක් පමණ මෙම E-Card පතින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් වී නොතිබුණි. අග්‍රහාර රක්ෂණ ක්‍රමය පිළිබඳව 2018 හා 2019 වර්ෂයන් වලදී දැනුවත් කිරීමේ

වැඩසටහන් 665 ක් පවත්වා ඇති බව සඳහන් කළද අදාල නියදි පරීක්ෂාවේදී ලද තොරතුරු අනුව එම වැඩසටහන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

**7.10** උක්ත 6.4.4 ඡේදයේ පරිදි 2012 වර්ෂයේදී චුම්භක කාඩ්පත් 250,000 ක් සඳහා ගෙවීම් කලද එම කාඩ්පත් 28,370 ක් සැපයිමට අදාල කොන්ත්‍රාත් ආයතනය අපොහොසත් වී තිබුණි. තවද එම කාඩ්පත් සඳහා වැඩිපුර ගෙවන ලද රු. 865,285 ක මුදල විගණිත දිනය වන විටත් ආපසු අයකර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණු අතර එම ආයතනය ද මෙම වාර්තාවේ දිනය වන විට අක්‍රිය වී තිබුණි. තවද එලෙස 2014 වර්ෂයේ ලද කාඩ්පත් සියල්ල අක්‍රිය තත්ත්වයේ පැවතීම හේතුවෙන් මෙම කාඩ්පත් සහ යන්ත්‍ර සඳහා ගෙවන ලද රු. 7,683,790 ක සම්පූර්ණ මුදලම අනාර්ථික වී ඇති බව නිරීක්ෂණය විය.

**7.11** 2018 ජූනි මස මිලදී ගන්නා ලද සාමාන්‍ය කාඩ්පත් වලින් සියයට 65 ක් එනම් 65,504 ක් හා 2019 පෙබරවාරි මස මිලදී ගන්නා රන් කාඩ්පත් ප්‍රමාණයෙන් සියයට 37 ක ප්‍රමාණයක් 2019 ඔක්තෝබර් 10 දින වන විටද ආයතනය තුල පැවතුණි. එම රන් කාඩ්පත් ප්‍රමාණයෙන් කාඩ්පත් 13,750 ක් සඳහා දත්ත ඇතුලත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. තවද, මෙම කාඩ්පත් නිසි ආරක්ෂාවක් හෝ නොමැතිව නව ගොඩනැගිල්ලෙහි පිටවීමේ දොරටුව අසල ගොඩගසා ඇති ආකාරයද නිරීක්ෂණය විය.

**ඡායාරූප අංක 01 - අග්‍රහාර කාඩ්පත් අනාරක්ෂිතව තැන්පත් කර ඇති ආකාරය**





**7.12** 12 / 2005 චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද ණය රක්ෂණාවරන ක්‍රමය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

**7.13** 2014 වර්ෂයේදී රු. මිලියන 267 ක පමණ ලාභයක් ඉපයීමට අරමුදලට හැකියාව ලැබී තිබුණද එම වර්ෂයේ සිට ක්‍රමයෙන් උපයන ලද ලාභය පහල ගොස් 2017 වර්ෂය වන විට රු.මිලියන 127 ක් හා 2018 වර්ෂයේදී රු.මිලියන 264 ක් ලෙස අලාභ ලබන තත්ත්වට පත්වී ඇති බව ඉහත වගුව අංක 07 හි තොරතුරු අනුව නිරීක්ෂණය විය.

## 8. නිර්දේශ

-----------

**8.1** අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමයක් වූ අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා මේ දක්වා දායක කර ගැනීමට නොහැකි වූ රාජ්‍ය සේවකයින් කඩිනමින් එම අරමුදලට දායක කර ගැනීම සඳහා කටයුතු කිරීම

**(යොමුව 7.1 )**

**8.2** අග්‍රහාර රක්ෂණ ක්‍රමයට දායක වී සිටින එක් එක් පුද්ගලයින් නමින් ගිණුම් ආරම්භ කර යාවත්කාලීනව පවත්වාගෙන යාමේ විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීමට අවශ්‍ය පියවර ගැනීම

**(යොමුව 7.3 )**

**8.3** අමාත්‍ය මණ්ඩල තීරණය මත පත්කල කමිටුව මඟින් හඳුන්වාදුන් නව යෝජනා ද ඇතුලත් කරමින් දැනට ක්‍රියාත්මක වන අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛයන් සංශෝධනය සඳහා විධිමත් පියවර ගනිමින් ප්‍රතිලාභීන් සඳහා ඉහල ප්‍රතිලාභ ලබාදීම

**(යොමුව 7.11 )**

**8.4** ඉහල පිරිවැයක් යටතේ මිලදී ගන්නා ලද විවිධ වර්ගයේ අග්‍රහාර කාඩ්පත් අදාල ප්‍රතිලාභීන්ට කඩිනමින් ලබාදීමට සැලැස්වීමත්, එමඟින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගැනීම

**(යොමුව 7.8, 7.10 )**

**8.5** 2012 වර්ෂයේදී අනාර්ථික ලෙස කාඩ්පත් හා යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකීම දරන පාර්ශව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කිරීම

**(යොමුව 7.9 )**

**8.6** ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සම්බන්ධයෙන් මෙන්ම වාර්තාවේ දිනය දක්වා ගෙවීමට කටයුතු නොකරන ලද අග්‍රහාර අයදුම්පත් සම්බන්ධයෙන් කඩිනමින් පියවර ගෙන ප්‍රතිලාභීන්ට සහන සැලසීමට අවශ්‍ය පියවර ගැනීම

**(යොමුව 7.5 )**

**8.7** ආයතනය විසින් ඉහල පිරිවැයක් යටතේ මිලදී ගෙන ඇති විවිධ වර්ගයේ කාඩ්පත් විධිමත් පරිදි ගබඩා කිරීමටත්, ප්‍රතිලාභීන්ට කාඩ්පත් නිකුත් කිරීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කරමින් නිකුත් කිරීමටත්, කාඩ්පත් එකකට වඩා නිකුත් කර ඇති අවස්ථාවන් පරීක්ෂා කර බලා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**(යොමුව 7.10 )**

**8.8** 2017 වර්ෂයේ සිට අරමුදල අලාභ ලැබීම සම්බන්ධයෙන් හේතු පරීක්ෂා කර අදාල ගැටළු සඳහා විසඳුම් ලබා දෙමින් අරමුදල නැවතත් ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට පියවර ගැනීම

**(යොමුව 7.12 )**

**8.9** අග්‍රහාර රක්ෂණය සඳහා භාණ්ඩාගාරය විසින් අරමුදලට දක්වන රු.69 ක දායකත්වය පිළිබඳව පවතින නීත්‍යානුකූලභාවය පිළිබඳව නිරවුල් කිරීම.

**(යොමුව 7.12 )**

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2021 මාර්තු 10 දින